ලිංගික අපයෝජනයක් යනු අපරාධමය ක්‍රියාවක් මෙන්ම සමාජ ගැටළුවක් ද වේ. ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී, එහි සැබෑ බරපතල භාවය ඒ අයුරින්ම පාඨකයාට ඉදිරිපත් කිරීම, එවැනි අපරාධ මැඩලීමට ද රුකුලක් නොවන්නේදැයි පාඨක අප විමසිය යුතු වේ. මන්දයත්, එවැනි සිදුවීම් සැහැල්ලු කොට දැක්වීම ඔස්සේ, ලිංගික අපරාධයන්/ලිංගික අපයෝජනයන් සාමාන්‍යකරණය වීමට ද හැකියාවක් ඇති බැවිනි.
කෙසේ නමුත්, තවමත් ඇතැම් මාධ්‍ය ඒ සම්බන්ධයෙන් වගකීම් සහගත නොවීම කණගාටුවට කරුණකි.
නිදසුනක් ලෙසට, අරුණ පුවත්පතේ ප්‍රධාන පිටුවේ (ජන. 26, 2023) "රෝගී කතුන් දැක්කම පෙන්ෂන් යන්න ඉන්න දොස්තර තිරිහන් වෙයි. දුරකථනයෙන් ලිංගික උපදෙසුත් දීලා" යන සිරස්තලයෙන් සහ උපසිරස්තලයෙන් යුතුව වාර්තා වී ඇති පුවත ගත හැක. මෙම පුවත සමඟින් කාටූනයක් ද දැක්වී ඇත. එසේම, පුවත් අන්තර්ගතය තුළ, මෙය ලිංගික අපයෝජනයක් බව සඳහන් වේ.
එසේම, මෙම පුවත ලංකාදීප වාර්තා කරන්නේ (ජන. 26, 2023), "කාන්තාවන්ට අමුතු බේත් දෙන කුරුණෑගල දොස්තර" යන සිරස්තලය සමඟිනි. එම පුවත් අන්තර්ගතය තුළ, මෙය ලිංගික අපයෝජනයක් ලෙසින් දැක්වේ.
මෙම පුවත් දෙකම, එක් ප්‍රාදේශීය වාර්තා කරුවකු විසින් ලියා ඇත. මාධ්‍යවේදීන් අපට මින් පෙර පෙන්වා දී ඇති පරිදි, පුවත් සඳහා සිරස්තල යෙදීම බොහෝ විට ඒ ඒ සංස්කාරකවරුන් අතින් සිදුවේ.
ඔබ සිතන ලෙසට,
1) මෙම සිරස්තල ඔස්සේ, ලිංගික අපයෝජන වරදක් සැහැල්ලු කොට (trivialisation) දක්වමින් ඉදිරිපත් නොවන්නේ ද?
2) මෙවැනි පුවත් වාර්තාවන් ඔස්සේ, ලිංගික අපයෝජනයන් සමාජය තුළ සාමාන්‍යකරණය වීමට අනුබල නොලැබේ යැයි ඔබ සිතන්නේ ද?
3) අරුණ පුවත සමඟින් ඉදිරිපත් කොට ඇති කාටූනය පිළිබඳ ඔබේ අදහස කුමක් ද? එම කාටූනය ද, එවැනි වරදක් සැහැල්ලු කොට දැක්වීමට රුකුලක් නොවන්නේ ද?
ලිංගික අපයෝජනයන් සුළු කොට නොදක්වමු!

